
# රන්කොත් වෙහෙර

- පොළොන්නරු යුගයට අයත් රන්කොත් වෙහෙර බුබ්බුලාකාර හැඩයෙන් යුක්තය .
- පොළොන්නරුවේ ආළාහන පිරිවෙන් භූමියට බටහිර දෙසින් මෙම ස්තූපය පිහිටා ඇත .
- මෙම දාගැබ නිශ්ශංකමල්ල රජතුමා විසින් කරවන ලද බව සඳහන් වේ .
- ස්තූපය උසින් අඩි 200 ක් පමණ වේ .
- චෛත්‍යයෙහි අට කොණේ පිළිමගෙවල් අටකි .
- දාගැබේ සතරැස් කොටුවේ සෑම මුහුණතකම අටපෙති නෙළුම් මල් දක්වා තිබීම අනෙකුත් ස්තූපවල නොමැති විශේෂත්වයකි .
- රන්කොත් වෙහෙර සතර දිසාවේ අලංකාර මල් ලියකම්වලින් යුතු වාහල්කඩ සතරකි .
- ධාතූන් වහන්සේලා ත ැන්පත් කර ඇතැයි සැලකේ .











( සටහන පොතේ ලියා ගන්න )

# කැලණි දාගැබ

- කැලණි විහාරයෙහි ඉදි කළ මුල් ම ස්තූපය අනුරාධපුර යුගයට අයත් බව සැලකේ .
- විවිධ කාලවල විවිධ රජවරු විසින් මෙම ස්තූපයේ ප්‍රතිසංස්කරණ කටයුතු සිදු කර ඇත .
- පසුකාලීන ව එය විනාශ වී තිබී 20 වන සියවසේ දී වර්තමාන තත්වයට ප්‍රතිසංස්කරණය කර ඇත .
- බුදුරජාණන්වහන්සේ බුද්ධත්වයෙන් අටවන වසරේ දී මණිඅක්ඛික නා රජුගේ ඇරයුමෙන් කැලණියට වැඩම කළ බව සඳහන් වේ .
- එහි දී මණිඅක්ඛික නා රජු ප්‍රමුඛ පිරිසට මිණිපළඟක වැඩ සිට ධර්මදේශනා කළ බව ද සඳහන් වේ .
- උන්වහන්සේ වැඩ සිටි මිණිපළඟ තැන්පත් කොට මණිඅක්ඛික නා රජු විසින් කැලණි ස්තූපය කරවූ බව මහාවංශයේ සඳහන් වේ .
- වර්තමාන ස්තූපය ධාන්‍යාකාර හැඩයෙන් යුක්ත අතර උස අඩි 90 ක් පමණ වේ .
- ස්තූපයේ සතර පැත්තේ මලසුන් ලෙස භාවිත කරන වාහල්කඩ සතරක් පිහිටුවා ඇත .





**පහත වගුව සම්පූර්ණ කරන්න**

| ස්තූපය | යුගය/කාලය | අනුග්‍රහය | හැඩය | උස | සුතූපය ආශ්‍රිත විශේෂනිර්මාණ හා කලා ලක්ෂණ |
|---|---|---|---|---|---|
| ථූපාරාම ස්තූපය | | | | | |
| රුවන්මැලි සෑය | | | | | |
| අභයගිරි ස්තූපය | | | | | |
| ජේතවන දාගැබ | | | | | |
| රන්කොත් වෙහෙර | | | | | |
| කැලණි ස්තූපය | | | | | |

# රූකඩ නිර්මාණය

රූකඩ කලාව ලංකාවේ අතීත සංස්කෘතික උරුමයක සේම ඒවා වර්තමානයේ ප්‍රාසාංගික කලාවක් ලෙස වර්ධනය වී ඇති ජනප්‍රිය කලා නිර්මාණ ලෙස හඳුනාගත හැකි වේ .

නිර්මාණය සඳහා භාවිතා කරන මාධ්‍ය හා ක්‍රියාකරවීමේ ස්වභාවය අනුව රූකඩ වර්ග කර ඇත .

රූකඩ වර්ග

නූල් රූකඩ | අත් රූකඩ | සෙවනැලි රූකඩ | රිටි රූකඩ | ඇඟිලි රූකඩ

රූපවාහිනි මාධ්‍ය තුළ අත් රූකඩ හා රිටි රූකඩ ඉතා ජනප්‍රිය වී ඇත.

විවිධ ඓතිහාසික හා කාලීන කතා වස්තු හා සිද්ධිවලට ඇතුළත් චරිත රූකඩ මගින් නිර්මාණය කරයි .
ඓතිහාසික කත අතර - ඇහැළේපොළ, සිරිසඟබෝ, අජාසත්ත, කාලගෝල, පටාචාරා, අංගුලිමාල, හා වෙස්සන්තර වැනි ජාතකය වැනි කතා සුවිශේෂ වේ .

රූකඩ නාට්‍ය ලංකාවේ අතීතයේ සිට පැවත එන ජනප්‍රිය කලාවකි .

වෙසක්, පොසොන්, හා ගම්මඩු වැනි ආගමික උත්සව අවස්ථාවලදී රූකඩ නාට්‍ය නිර්මාණවල ගුණාත්මක හා කලාත්මක වර්ධනය සඳහා වැදගත් වේ .

පසුබිම් සංගීතය, ගීත, දෙබස්, ආලෝකකරණය යන අංග රූකඩ නිර්මාණවල ගුණාත්මක බව වර්ධනය සඳහා උපයෝගි වේ .

රූකඩ නාට්‍ය සඳහා බොහෝ විට ගායනා කරනු ලබන්නේ නූර්ති හා නාඩගම් ගීත යි . ගායනය හා දෙබස් කීම බොහෝ විට රූකඩ නාට්‍ය ශිල්පීන් විසින් ම සිදු කරයි .

රූකඩ නිර්මාණය සඳහා වේදිකා නිර්මාණ හා පසුතල නිර්මාණ ඉතා වැදගත් තැනක් ගනු ලැබේ .

රූකඩ නාට්‍ය සඳහා විශේෂ වේදිකා නිර්මාණ හා පසුතල නිර්මාණ ද සකස් කෙරේ . මෙම වේදිකා ඉතා කුඩා වන අතර ඒවා ඇස් මට්ටමින් ඉහළ සකස් කෙරේ .

රූකඩ නිර්මාණ සඳහා විවිධ ද්‍රව්‍ය භාවිතා කෙරේ . ප්‍රධාන වශයෙන්දැව භාවිත කරන අතර, ඒ සඳහා කඳුරු ලී හෝ රුක්අත්තන ලී උපයෝගී කර ගනී . ඊට අමතරව රෙදි , නූල්, යකඩ, ඇණ , බයිසිකල් ටියුබ් කැබලි , පබලු වර්ග, සායම් වර්ග භාවිතා කෙරේ .

## නූල් රූකඩ

නූල් රූකඩ පාරම්පරිකව පැවත එන කලාවකි . මේ සඳහා ප්‍රසිද්ධියක් උසුලන්නේ අම්බලන්ගොඩයි . සංදර්ශන පවත්වනු ලබන වේදිකාවේ ඉහළින් අට්ටාලයක් මත සිට නූල් මගින් රූකඩ නැටවීම සිදු කරයි .මෙවැනි රූකඩ සෑදීම සඳහා දියකඳුරු වැනි සැහැල්ලු ලී වර්ග භාවිත කරයි . අට්ටාලය මත සිට රූකඩ නටවන පුද්ගලයන් අතේ නූල් රැඳවූ ලී සැකිල්ලක් ඇත . එම ලී සැකිල්ලට නූල් රුකඩය සම්බන්ධය සිදු කරනු ලබන්නේ අත්, පා, හිස, චලනය වන ආකාරයෙනි .ඒ සඳහා බයිසිකල් ටියුබ් කැබලි භාවික කෙරේ . එය නිසියාකාරව සෙලවීම මගින් අදාළ රූකඩය නැටවීමක් සිදු කරයි .






## අත් රූකඩ

අත් රූකඩ ඉතා සරල ද්‍රව්‍ය භාවිතයෙන් නිර්මාණය කළ හැකි වේ . රෙදි කැබලි , අත් මේස් , බොත්තම් , පබළු , නූල් , මැලියම් කම්බි වැනි විවිධ ද්‍රව්‍ය මේ සඳහා අත් රූකඩ නටවනු ලබන්නේ අත සෙලවීමට ලක්කිරීමෙනි . මෙහිදී අත්වලට අදාළ අත් රූකඩය නටවනු ලබන්නේ අත සෙලවීමට ලක්කිරීමෙනි . මෙහිදී අත්වලට අදාළ අත් රුකඩය ඇතුල් කරන අතර අත්වල ඇති ඇඟිලි සොලවන විට අදාළ අත් රූකඩයේ කන් සෙලවීම , කට සෙලවීම , හිස සෙලවීම සිදු කරනු ලබයි .මෙහිදී ශිල්පියා සිටින්නේ පහතිනි . එය නරඹන්නාට ඔහු වැසෙන සේ රාමුවක් තබා ඇත .එම නිසා නරඹන්නාට අත් රූකඩය නටවන්නා නොපෙනේ . එම නිසා ශිල්පියා අත් උඩට ඔසවා අත්වල දමා සිටින රූකඩ නැටවීමට ලක් කරයි .





## සෙවනැලි රූකඩ





## රිටි රූකඩ



## ඇඟිලි රූකඩ





නූල් රූකඩ ඇසුරෙන් රඟ දක්වන ඇහැලේපොළ කතාවේ අවස්ථාවක්

**පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න .**

1) නරඹන ලද තමන් කැමති රූකඩ වැඩසටහනක ඇති චරිතවල ගති ලක්ෂණ හා ස්වභාවය පිළිබඳව විස්තර කරන්න .

2) රූකඩ නිර්මාණයට යොදාගත හැකි අමු ද්‍රව්‍ය ලියා දක්වන්න .

3) ඔබට නිර්මාණය කළ හැකි රූකඩයක සැලසුමක් ඇඳ දක්වන්න .

4) රූකඩ සංදර්ශනයක් රඟ දැක්වීමට සුදුසු නාට්‍ය දෙබස් සහිත පිටපතක් ලියා දක්වන්න .